# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2407/03 - 2024 ඔක්තෝබර් මස 22 වැනි අඟහරුවාදා - 2024.10.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම - සංශෝධන අංක 09**

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2013 නොවැම්බර් මස 11 වැනි දිනැති අංක 1836/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ඩබ්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2024 ඔක්තෝබර් මස 22 වැනි දින.

I කොටස

සංශෝධන අංක 01 - 2014 නොවැම්බර් මස 05 වැනි දින හා අංක 1887/21 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 02 - 2015 මාර්තු මස 09 වැනි දින හා අංක 1905/7 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 03 - 2017 පෙබරවාරි මස 17 වැනි දින හා අංක 2006/53 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 04 - 2017 දෙසැම්බර් මස 12 වැනි දින හා අංක 2049/14 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 05 - 2019 අගෝස්තු මස 28 වැනි දින හා අංක 2138/27 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 06 - 2020 අගෝස්තු මස 25 වැනි දින හා අංක 2190/26 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 07 - 2021 ජුනි මස 23 වැනි දින හා අංක 2233/27 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 08 - 2022 ඔක්තෝබර් මස 25 වැනි දින හා අංක 2303/04 *අති විශෙෂ ගැසට් පත්‍රය*


1A - G 42949— 05 (2024/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

II කොටස

7.2.5 බඳවාගැනීමේ ක්‍රමය

7.2.5.1 ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. බඳවා ගැනීමේ තරග විභාගය සම්බන්ධ කරුණු උපලේඛන II හි දැක්වේ.

7.2.5.1.1 ලිඛිත පරීක්ෂණය පවත්වන නිලධාරියා සහ ඒ යටතේ වන කරුණු ඉවත් කර පහත පරිදි ආදේශ කරනු ලැබේ.

ලිඛිත පරීක්ෂණය පවත්වන නිලධාරියා - අවස්ථානුකූලව විභාග කොමසාරිස් ජනරාල් හෝ පත්වීම් බලධාරියා විසින් අනුමත කරනු ලබන වෙනත් ආයතනයක්

7.2.5.2.1 යටතේ වන කරුණු ඉවත් කර පහත පරිදි ආදේශ කරනු ලැබේ.

අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණු අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එක් එක් විෂයය ක්ෂේත්‍රයයන් (සිවිල්, යාන්ත්‍රික, විදුලි, රසායන හා භූ සම්පත්) යටතේ බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

පවතින උපලේඛන II වෙනුවට පහත උපලේඛන II ආදේශ කරනු ලැබේ.

## උපලේඛන II

සෘජු බඳවාගැනීම් සඳහා පවත්වනු ලබන ලිඛිත විභාගයේ අරමුණු සහ ක්‍රමවේදය

(අ) ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ ඉංජිනේරු තනතුරු අපේක්ෂාවෙන් අයදුම් කරනු ලබන ඉහත 7.2.3 අනුව සුදුසුකම් සපුරා ඇති ඉංජිනේරුවන්ගේ බඳවා ගැනීමේ අනුපිළිවෙල නිශ්චය කරගැනීමේ අරමුණින් මෙම විභාගය පවත්වනු ලැබේ. එබැවින් ඉහත විභාගය ලකුණු 100කින් සමන්විත ලිඛිත අභියෝගතා පරීක්ෂණයකට සීමා කරනු ලැබේ. විභාග ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න වලින් සමන්විත වන අතර, ඒ සඳහා පැය 1 1/2ක කාලයක් ලබාදේ. ඉහත විභාගයේ දී අපේක්ෂකයින් ලබාගන්නා ලකුණු මත බඳවාගැනීමේ අනුපිළිවෙල තීරණය කරනු ඇත.

(ආ) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පැවැත්වේ. අපේක්ෂකයන් කැමැති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(ඇ) ඉහත 7.2.3 සඳහන් ඉංජිනේරු විද්‍යාව හැදෑරීම තුලින් ලබාගත් දැනුම මත අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල තත්ත්වයත්, විශ්ලේෂණ තත්ත්වයත්, තීරණ ගැනීමේ හැකියාවත් විනිශ්චය කිරිම අරමුණු කරගෙන මෙම විභාගය සම්පාදනය කර ඇත.

EOG 10 - 0195

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.